සියලු ම හිමිකම් ඇවිරිණි.
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගැයීම
இரண்டாம் தவணை மதிப்பீடு - 2018
Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 08 | විෂය / பாடம் / Subject } ඉස්ලාම් | පත්‍රය / வினாத்தாள் / Paper } I,II | පැය / மணித்தியாலம் / Hours } 1 |

## කොටස - I

### සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- **ඉතා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. අවසාන ආගම වූ අල්කුර්ආනය පහළවූ මාසය,

   1. ෂහ්රු දුල්හිජ්ජා  2. ෂහ්රු රමලාන්  3. ෂහ්රු සව්වාල්

2. රමලාන් මාසයේ අවසාන දින දහයේ දී මස්ජිදයේ රැඳී සිට ඉටුකරන අමල්,

   1. ඉහ්තිකාෆ්  2. හිස්බුල් කුර්ආන්  3. කියාමුල්ලෛල්

3. ඉස්ලාමීය ආර්ථිකයේ ප්‍රධාන අංගයක් ලෙස සලකනු ලබන්නේ,

   1. සදකා  2. හදිය්‍යා  3. සකාත්

4. අල්ලාහ් සමාව කරන්නාය ,කරුණාවන්තයාය යන්න හැඳින්වෙන අරාබි පද,

   1. අල් කබූර් අර් රහීම්  2. අල් වදූද් අල් අසීස්  3. අල් කරීම් අර් රහීම්

5. ''නියත වශයෙන්ම අල්ලාහ්ගේ ගැත්තන්ගෙන් ඔහුට බියවන්නෝ ආලිම්රුන්ය'' යන්න,

   1. නබිවරයාගේ වදනක්  2. අල් කුර්ආනයේ වදනක්  3. සහාබිවරුන්ගේ වදනක්

6. වාක්‍ය හතකින් සමන්විත වූ සූරා අල් මාඌන් අල් කුර්ආනයේ කීවෙනි සූරා ද?

   1. 96 වෙනි  2. 97 වෙනි  3. 107 වෙනි

7. කුඩා දරුවන් සමග සෙල්ලම් කරමින් සිටි දරුවෙකුව වඩා ගත් අබූබක්කර් (රලි)තුමා, මොහු නබි(සල්) තුමාණන්ගේ හැඩයෙන් සමානව සිටියි. මෙහි සඳහන් එම කුඩා දරුවා,

   1. හසන් (රලි)  2. හුසෛන් (රලි)  3. සෛද් (රලි)

8. අල්ලාහ්, තමා කැමති කෙනෙකුට ලබා දෙන භාග්‍ය,

   1. ධන සම්පත්  2. ශරීර සෞඛ්‍ය සම්පත්  3. අධ්‍යාපන ඥානය

9. අල්කුර්ආනය සඳහන් පරිදි සකාත් ලැබීමට හිමිකම් ඇති කාණ්ඩ ගණන,

   1. කාණ්ඩ 8  2. කාණ්ඩ 10  3. කාණ්ඩ 7

10. 'අපි නොකඩවා පාප ක්‍රියාවල යෙදී සිටියොත් අල්ලාහ් අපව විනාශ කරයි' එසේ පාප ක්‍රියාවන් කර විනාශ කරන ලද කණ්ඩායම් දෙක,

1. අවුස්, කස්රජ්     2. ආද්, සමූද්     3. උහද්, තබූක්

- **ඉතා සුදුසු පරිදි යා කරන්න.**

11. සූරා අල් කෑෆ් — A. තර්තීල්
12. රාත්‍රී පුරා නැමදුම්වල යෙදීම — B. කියාමුල්ලෛල්
13. අල්කුර්ආනය නිවැරදිව පාරායනය කිරීම — C. සිකුරාදා
14. සලාතුල් ඉස්තිහාරා — D. උසස් යහ ගුණාංග
15. හුලුකුන් අලීම් — E. උපකාර පතා සලාතය ඉටු කිරීම

- **සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.**

16. අවසාන දිනයේ මුඃමින්වරයෙකුගේ තරාදියේ අධික ලෙස බර ඇති කරනු ලබන්නේ ..............................
17. සියලු දරුවන් ඉපදීමේ .............................................. දරුවන් ලෙස ඉපදේ.
18. අල් කුර්ආනය විශ්වාසය කර පාරායනය කරන කෙනෙකුට එය .................................... අල්ලාහ් සමග වාද කරයි.
19. මුස්ලිම්වරයෙකුගේ ප්‍රාර්ථනා සඳහා අල්ලාහ් ක්‍රම තුනෙන් එකකින් ...................................... නොසිටියි.
20. තමා ප්‍රිය කරන දේ තම සොයුරාට ද ප්‍රිය කරන තෙක් ඔබෙන් කිසිවෙක් ................................ නොවේ.

***

# කොටස - II

- **ඕනෑම ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) 1. කුඩා දරුවන් වැඩිහිටියන්ගෙන් බලාපොරොත්තු වන දේවල් **03ක්** සඳහන් කරන්න.

2. සබි(සල්) තුමාණන් කුඩා දරුවන් කෙරෙහි දැක්වූ ආදරය පිළිබඳ ආකාර **03ක්** සඳහන් කරන්න.

3. ආහාර ගැනීමේදී පිළිපැදිය යුතු යැයි නබි (සල්)තුමාණන් විසින් අබූ හෆ්ස් (රලි) තුමාණන් වෙත පවසන ලද උපදෙස් 03 කුමක්ද?

(ලකුණු 3+3+6=12)

(02) 1. රළු සිතකින් යුතු කෙනෙකු තම සිත සන්සුන් කර ගැනීම සඳහා පිළිපැදිය යුතු යැයි නබි(සල්) තුමාණන් විසින් පවසන ලද කරුණු **තුන** සඳහන් කරන්න.

2. අනාථයන් කෙරෙහි මුස්ලිම්වරයෙකු හැසිරිය යුතු ආකාරය පිළිබඳ කරුණු **03ක්** සඳහන් කරන්න.

3. අනාථයන් භාරගන්නා කෙනෙකුගේ විශේෂත්වය පිළිබඳ නබි (සල්) පවසන ලද හදීසයක් සම්පූර්ණයෙන් ලියන්න.

(ලකුණු 3+3+6=12)

(03) 1. 'ආලිම්වරු' යනු කවුරුන් ද?.

2. පාලකයන්ගේ දඩුවමට ලක්වී සිර ගතවූ ආලිම්, ඉමාම්වරුන් **තුන්දෙනෙකුගේ** නම් ලියන්න.

3. ආලිම්වරුන් ගරු කළ හැකි අයුරු පිළිබඳ යෝජනා **03ක්** ඉදිරිපත් කරන්න.

(ලකුණු 3+3+6=12)

(04) 1. ජීවිතයේ වළක්වා ගත යුතු දුර්ගුණාංගයන් **06ක්** ලියන්න.

2. දුර්ගුණාංග නිසා කෙනෙකුගේ ජීවිතයේ ඇති විය හැකි හානි **03ක්** සඳහන් කරන්න.

3. නබි (සල්) තුමාණන්ගේ යහගුණාංගයන් පිළිබඳ අල්කුර්ආනය කෙසේ වර්ණනා කරයි ද?

(ලකුණු 3+3+6=12)

(05) 1. යහපත් ක්‍රියාවන් හා අයහපත් ක්‍රියාවන් මිනිසෙකුගේ සිත් තුළ ඇති කරන සිතුවිලි පහදන්න.

2. අවසන් දින විනිශ්චයේ දී ඉදිරිපත් කරනු ලබන සාක්ෂීන් මොනවා ද?

3. හදීස්වල සඳහන් වන මහා පාප ක්‍රියාවන් **හතරක්** සඳහන් කරන්න.

(ලකුණු 4+4+4=12)

(06) 1. විශ්වාසය නිසා ඇතිවිය හැකි ක්‍රියාවන් 02ක් සඳහන් කරන්න.

2. අවසන් නබි (සල්) තුමාණන් අල් අමීන්, අස් සාදීක් යනුවෙන් හැඳින්වීමට මූලිකවූ කරුණ පැහැදිලි කරන්න.

3. වංචනික ක්‍රියාවන්හි නොයෙදිය යුතුයි. යන්න තහවුරු කිරීම සඳහා උදාහරණයක් මගින් සිද්ධියක් විස්තර කරන්න.

(ලකුණු 4+4+4=12)

(07) 1. ගමනක් යෑමේදී පිළිපැදිය යුතු විධි විධානයන් විස්තර කර ලියන්න.

(ලකුණු 12)

***